# බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනයක්

*සෙව්වන්දි ඒ.එම්.සී.*[1]

බෙල්ලන්විල රජමහා විහාරය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලාංකේය බෞද්ධ ජනතාවගේ ගෞරවයට පාත්‍ර වන උරුමයකි. මෙහි අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන මෙන් ම ක්ෂේත්‍ර නොවන අධ්‍යයනයන් ද සිදු කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යනයනය වසයෙන් එම විහාර පරිශ්‍රයේ සිතුවම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම, වැඩිහිටි පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා කර දත්ත ලබාගැනීම සිදු කිරීම සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යනය ලෙස බෙල්ලන්විල රජමහා විහාරය පිළිබඳ මූලාශ්‍රයන් පරිශීලනය කර තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. නූතන අවධියට මෙම විහාරයේ රූප මන්දිරය කලාත්මක ව සැරසීමට සෝමබන්දු විද්‍යාපති සමත් වී තිබේ. බෞද්ධ සාහිත්‍යයේ එන සංසිද්ධීන් සිතුවමට නැඟීමට කටයුතු කර තිබෙන අතර ඔහු විසින් බෞද්ධ චිත්‍ර කලාවට නව අරුතක් එක් කිරීමට උත්සාහ දරා තිබේ. මෙම සිතුවම් අතර මාර පරාජය, නාටිකාංගනාවන්ගේ විප්‍රකාර, පටාචාරාගේ දරු සෙනෙහස, සිදුහත් උපත, ශිල්ප හැදෑරීම, විවාහ මංගල්‍යය, සතර පෙරනිමිති, සිද්ධාර්ථ කුමරුගේ සැපවත් ගිහි ජීවිතය, අභිනිෂ්ක්‍රමණය, සුජාතාවන් කිරිපිඬු පූජා කිරීම, පළමු සතිය හා සවැනි සතිය, රෝගී භික්ෂුවකට බුදුන් වහන්සේ විසින් උවටැන් කිරීම, අංගුලිමාල දමනය, දේවදත්ත පුවත ආදි සිතුවම් හඳුනාගත හැකි ය. ඒ අතර ම බෞද්ධ ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ සමීපතම මිතුරා වන ධර්මාශෝක රජු පිළිබඳ සිතුවම් කිහිපයක් ද මෙහි නිරූපණය කර ඇත. බෙල්ලන්විල විහාරයේ දක්නට ලැබෙන සිතුවම් කොළඹ යුගයේ නූතන අවධියේ විහාර සිතුවම් සම්බන්ධයෙන් අතිශය වැදගත් සාදක ලෙස පෙන්වා දිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** බෙල්ලන්විල රජමහා විහාරය, සිද්ධාර්ථ, සිතුවම්, නූතන අවධියේ බිතුසිතුවම්, උරුමය

[1] පුරාවිද්‍යා සහ උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. chethanasewwandi00@gmail.com